www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සුනාමියෙන් දිවි ගලවා ගත් ශ්‍රී ලංකාවේ නැගෙනහිර ජනයා *ලෝසවෙඅට* කතා කරති.

## Tsunami survivors in Sri Lanka's east speak to the WSWS

**එම්. අරවින්දන් සහ සරත් කුමාර විසිනි**
**2005 ජනවාරි 08**

ශ්‍රී ලංකාවේ නැගෙනහිර අම්පාර නගරයේ හා අවට සුනාමියෙන් දිවි ගලවා ගත් ජනයාට දෙසැම්බර් 29 දා සිට ජනවාරි 1 දා දක්වා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ)* කන්ඩායමක් කතා කලහ. දෙසැම්බර් 26 දා සිදු වූ ඛේදවාචකයෙන් අවම වසයෙන් ප්‍රදේශයේ 25,000ක් දෙනා මරනයට පත් වූ අතර 166,000 ට වැඩි දෙනකුට නිවාස අහිමි විය. තවත් 80,000ක් දෙනා දැන් ජීවත් වන්නේ සරනාගත කඳවුරුවල ය.

අප නැරඹූ සෑම කඳවුරක ම කතාව එක සමාන ය. රජයේ උදාසීනත්වය, නිලධාරිවාදී නො තකා හැරීම, රුදුරු කොන්දේසි හා විශේෂයෙන් ම උග්‍ර සනීපාරක්ෂක ගැටලු. ඒ අතර ම විවිධ වාර්ගික හා ආගමික ප්‍රජාවන් අතර සාමූහික හැඟීම පෙර නුවූ විරූ මට්ටමක පැවතිනි. සුනාමියට ගොදුරු වූ දෙමල හා මුස්ලිම් ජනයා අතර සාමාන්‍ය සිංහල ජනයාගෙන් ලැබුනු සහයෝගය හා ආධාරය පිලිබඳව පුලුල් අගය කිරීමක් තිබුනි. රටෙහි දීර්ඝ කාලීන සිවිල් යුද්ධය තුල දී පාලක ප්‍රභූ තන්ත්‍රයන් විසින් දැනුවත් ව ම වගාදිගා කරන ලද සිංහල හා දෙමල වැඩකරන ජනතාවන් අතර ඇති බෙදීම්වලට, සුනාමියට දක් වූ ප්‍රතිචාරය මගින් යටි වල කපා තිබේ.

දෙසැම්බර් 29 දා උදේ හරියට ම 9.30 ට අම්පාරේ සිද්ධාර්ථ විද්‍යාලයීය සරනාගත කඳවුරට අපි ලඟා වීමු. මෙම කඳවුරේ කල්මුනේ, පදිරිප්පු, කරයිතිවු, නින්දවූර් හා පරිය නිලවනයි වැනි ගම්මානවලින් පැමිනි සරනාගතයෝ 1,300කට වැඩි පිරිසක් වූහ. ප්‍රදේශයේ විවිධ සංවිධානවලින් පැමිනි තරුන ස්වේච්ඡා සේවකයෝ උදේ ආහාරය පිලියෙල කරමින් සිටියහ. දෙසිය පනහක් පමන සරනාගතයෝ තමන්ගේ නිවාසවලින් ඉතිරි වී ඇති දෑ බැලීමට තම ගම්මානවලට ආපසු යාම සඳහා බස්රථවලට ගොඩ වෙමින් සිටියහ.

සනීපාරක්ෂාව බරපතල ගැටලුවකි. වැසිකිලි දෙකක් පමනක් තිබූ අතර ඒ දෙක ම නරක තත්වයේ විය. මෙය සෑම කඳවුරක ම සාමාන්‍ය තත්වයකි. සමහර ස්ථානවල වැසිකිලි වලවල් හාරා තිබුන ද ධාරානිපාත වර්ෂාවට ඒවා ජලයෙන් පිරී තිබුනි. බලධාරීන් තමන්ගේ පැමිනිලි නො සලකා හැර ඇති බව සරනාගතයෝ අපට කීහ. සරනාගතයන්ට ආහාර හා ඇඳුම් ලැබී තිබුනු නමුත් නිදන පැදුරු හා ඇඳන් සපයා තිබුනේ අඩුවෙනි. හිසට සෙවනක් ලැබීම ද ප්‍රශ්නයක් විය. විදුහලක කුඩා පන්ති කාමරවල ජනයා බොහෝ දෙනා තදබද වී සිටියහ.

දවස පුරා ම අපි සුනාමියට ගොදුරුවූවන් සමග කතා කලෙමු. කරයිතිවු සිට පැමින සිටි 18 හැවිරිදි හින්දු ආගමික පාසල් ගුරුවරියක වූ ජී. පුනිතාවතී, අසල්වාසී සිංහල හා මුස්ලිම් ප්‍රජාවන්ගෙන් ලත් සහයෝගය පිලිබඳව කෘතඥතා පූර්වකව කතා කලා ය. ''සටන් විරාමය නිසා අපට ඔවුන්ගේ සහයෝගය ලැබුනා. යුද්ධය තව දුරටත් තිබුනි නම් තත්වය වඩාත් නරක්වන්නට ඉඩ තිබුනා. මෙම කඳවුරට සිංහල ජනතාව ඇඳුම්, ආහාර, ජලය, මදුරු කොයිල් හා අනෙකුත් දෑ ගෙනැවිත් දුන්නා'' යැයි ඇය පැවසුවා ය.

ව්‍යසනයට පෙර පුනිතාවතී මදරායි නගරයේ සර්වෝදය සංගමයේ වැඩ කලා ය. ''මා එහි සතියක් සිටියා. එහි දී සිංහල ජනයා බොහෝ දෙනකු සමග කතා කලා. කොටි සංවිධානය යක්ෂයින් සහ සියලුම දෙමල ජනයා එල්ටීටීඊයට අයත් යයි වැරදි අවබෝධයක් තිබෙනවා. කතා කිරීම තුලින් වඩා හොඳින් අප එකිනෙකා අවබෝධ කර ගත්තා.''

ඇයගේ පවුල සහ ගම්මානය සුනාමියෙන් පසුව මුහුන දී සිටින අසීරු සහගත තත්වය ඇය කෙටියෙන් විස්තර කලා ය. ''මගේ පියා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික සේවකයෙක්. මසකට විශ්‍රාම වැටුප ලෙස ලැබෙන්නේ රුපියල් 5,000ක් පමනයි. මා ස්වේච්ඡා ගුරුවරියක් කිසිදු ගෙවීමක් ලබන්නේ නැහැ. දෙසැම්බර් 28 දා මාත් පියාත් අපේ නිවස බැලීමට ගියා. එය විනාශ වී ගිහින්. අවට ප්‍රදේශයේ ඒ වන විටත් මල සිරුරු තිබුනා.

''එහි ගොස් ජීවත් වීමට මට බයයි. ආන්ඩුවෙන් සහයෝගයක් ලැබෙයි කියා මා හිතන්නේ නැහැ. ඔවුන් අපිට රුපියල් 10,000ක් හෝ 15,000ක් දෙයි. ඒකෙන් මොනවා කරන්න ද? පසු ගිය මැතිවරනයේ දී අපි සහයෝගය දුන්නේ දෙමල ජාතික සන්ධානයට. මට

ඡන්දය තිබුනේ නැහැ. මගේ දෙමව්පියන් ඔවුන්ට ඡන්දය දුන්නා. නමුත් ඔවුන් අපව බැලීමට වත් ආවේ නැහැ. මේ ව්‍යසනයට කලින් අප ගං වතුරටත් මුහුන දුන්නා. ආන්ඩුවේ කිසි ම නිලධාරියෙක් අපට උපකාර කරන්න ආවේ නැහැ.''

නිවාස 2,000ක් විනාශ කරමින් හා පවුල් 16,000ක් අවතැන් කරමින් සුනාමියට පෙර ඇති වූ ගංවතුර ව්‍යසනකාරී බලපෑමක් ඇති කොට තිබුනි. කල්මුනේ සිට පැමිනි ගොඩනැගිලි සේවකයෙකු වන වී. මහේස්වරන් එහි බලපෑමට අසු වූවෙකි. ''ගංවතුර බලපෑම නිසා සුනාමිය පැමිනෙන විට අප නැවතී සිටියේ මුහුදට ආසන්නව පිහිටි මගේ ඥාතියෙකුගේ නිවසේ. ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මගේ නිවස තුන් වතාවක් ගංවතුරට හසු වුනා. මෙහි පැමින අපගේ සුවදුක් විමසූ ප්‍රථම පිරිස ඔබයි. අප ගංවතුරේ හසු වී සිටින විට සහනාධාර අරමුදල් දුන්නේ නැහැ. මට සුදුසු රැකියාවක් නැහැ. මගේ දෛනික වැටුප රුපියල් 300ක් වන අතර සමහර දිනවල කිසිදු වැඩක් ලැබෙන්නේ නැහැ.''

කඳවුරේ සිටි තරුන ගැහැනු ලමයෙක් මෙසේ විස්තර කලා ය. ''සුනාමිය විසින් හැම දෙයක් ම විනාශ කලා. ස්වෙච්ඡා සේවක පිරිසක් මාව අම්පාරට ගෙන ඒම සඳහා ට්‍රක් රථයකට දැමුවා. එය සිංහල නගරයක් නිසා මා බිය වුනා. මගේ පවුලේ අය මා සමග සිටියේ නැහැ. සතුරු වටපිටාවක දී කවුරු මාව ආරක්ෂා කරාවි දැයි මම සිතමින් සිටියා. මා බිය වුනා. සියලු ම සිංහලයන් නරක යයි මම සිතා සිටියත් එය වැරදියි.

''අම්පාරට පැමිනි විට සිංහල ජනතාව පිලිබඳව මට තිබූ අදහස සම්පූර්නයෙන් වෙනස් වුනා. ඔවුන් අපට උදව් කලා. ආහාර හා ඇඳුම් සැපයුවා. හිලව්වට කිසිවක් නො ගෙන ඔවුන් අපට ආහාර පවා පිලියෙල කර දුන්නා. අතර මග දී අපට මුස්ලිම් ප්‍රදේශයක් පසු කර ඒමට තිබුනා. මුලදී මා සිතා සිටියේ ඔවුන් ද දෙමල ජනයාට විරුද්ධ යයි කියලා. නමුත් එය එසේ නො වන බව දැන් මා තේරුම් ගෙන තිබෙනවා. මේ ජනයාත් සුනාමියේ බලපෑමට හසු වී සිටියත් ඔවුන් අපට උදව් කලා. මම ඒ වෙනුවෙන් ස්තූති කරනවා.''

මධ්‍යම ගමනාගමන මංඩලයේ කාර්මිකයෙකු වන සිව කුමාර්, සුනාමිය නිසා තම පවුල් අහිමි වූ දහස් ගනනක් ජනයා අතර එක් අයෙකි. ''මා වැඩ කරන්නේ කල්මුනේ ඩිපෝවේ. මට දරුවන් හතර දෙනකු සිටියා. ඔවුන්ගෙන් තිදෙනෙක් හා මගේ බිරිඳ මිය ගොසින්. කකුලේ අමාරුවක් නිසා ඇවිදීමේ ආබාධයකින් පෙලුනු මගේ බිරිඳ ඔටෝ ට්‍රයිසෝවක් (රෝද තුනකින් සමන්විත කුඩා වාහනයක් ) පාවිච්චි කරමින් සිටියා. එය ගසා ගෙන ගිහින්. මගේ නිවස සම්පූර්නයෙන් ම විනාශ වෙලා. වැඩිමහල් දියනිය පමනයි ඉතිරිව සිටින්නේ. අසල්වාසීන්ගේ උදව්වෙන් ඇය බේරුනා.''

සිව කුමාර් රජයේ නිලධාරින්ට දොස් පැවරී ය. ''කල් තබා අනතුරු ඇඟවීමක් තිබුනෙ නැහැ. මේ ව්‍යසනය සිදුවීමට ඉඩ දුන්නේ ඉහල නිලධාරින් හා කාලගුන නිලධාරීන්. ඔවුන් කඩිසරව ක්‍රියා කලා නම් ජීවිත වැඩි ප්‍රමානයක් බේරා ගැනීමට තිබුනා.''

ශ්‍රී ලංකාවේ නැගෙනහිර අනෙකුත් බොහෝ ප්‍රදේශ මෙන් ම කල්මුනේ දෙමල හා මුස්ලිම් ප්‍රදේශ වසයෙන් බෙදී පවතී. සුනාමියෙන් පසු ප්‍රජාවන් දෙකේ ම ජනතාව එකතු වී සිටිති. ''සාමාන්‍යයෙන් දෙමල ජනයා දෙමල දේශපාලනඥයන්ටත් මුස්ලිම් ජනයා මුස්ලිම් දේශපාලනඥයන්ටත් ඡන්දය දෙනවා'' යි සිවකුමාර් විස්තර කලේ ය. ''නමුත් කිසිදු දේශපාලනඥයෙක් අප බැලීමට පැමිනියේ නැහැ. සිංහල ජනයා පමනක් දෙමල හා මුස්ලිම් අය සමග වැඩ කිරීමට පැමින සිටිනවා. අප සියලු දෙනා ම එකිනෙකාට උදව් කර ගන්නවා.''

## මුස්ලිම් ප්‍රදේශ

පසු ගිය වසරේ දී මුස්ලිමුන් හා අසල්වාසී දෙමල ජනයා අතර වාර්ගික ආතතීන් අවුස්සාලනු ලැබූ ප්‍රමුඛ මුස්ලිම් ප්‍රදේශයක් වන සමන්තුරේහි සරනාගත කඳවුරක් නැරඹීමට ද ලෝසවෙඅ නියෝජිත කන්ඩායම ගියහ. සුනාමියේ ප්‍රහාරයට ලක් වූ තැන් පටන් ආහාර හා ක්ෂනික නිවාස අවශ්‍යතා සපයන මෙම කඳවුර වර්ග දෙකේ ම අවතැන් වූ පවුල්වලට රැකවරන සලසයි. පසු ගිය කාලසීමාවේ දී තමන්ට සහයෝගය ලබා ගැනීම සඳහා දෙමල හා මුස්ලිම් දේශපාලනඥයෝ ස්වෝත්තමවාදය යොදා ගෙන ඇති නමුත් මෙම බේදවාචකය ආගමික හා වාර්ගික වෙනස්කම් ඉක්මවා ගොස් ඇත.

මරුතමුනෙයි හි ප්‍රධාන සහන සේවා මධ්‍යස්ථානයේ ස්වෙච්ඡා සේවකයකු වන අබ්දුල් හලාම් අපට කීවේ ''ව්‍යසනයට එතරම් ගොදුරු නො වූ ගම්මානවල වැසියන්ට පැමින අපට උදව් කරන ලෙස අප ආයාචනා කලා තරුනයින් විශාල සංඛ්‍යාවක් පැමිනෙමින් සිටිනවා. දෙසැම්බර් 28 දා අපට 2,000ක් පමන වන ස්වේච්ඡා සේවක සංඛ්‍යාවක් සිටි අතර අද 1,000කට වැඩි ප්‍රමානයක් සිටිනවා. සිරුරු සොයාගැනීම, පිරිසිදු කිරීම, සරනාගතයන්ට උදව් කිරීම ආදී සියලු දේ ස්වේච්ඡා සේවකයන් කරමින් සිටිනවා. ප්‍රධාන මාර්ගය අවහිර වී ඇති නිසා වෙනත් මාර්ගවලින් පැමිනීමට ඔවුන්ට සිදුව තිබෙනවා. නමුත් ඔවුන් පැමින සිටිනවා. දෙමල ප්‍රදේශවල සමහර කඳවුරුවලට ආධාර ලැබෙන්නේ අඩුවෙන් බව අපට දැන ගැනීමට ලැබුනා. ඒ නිසා අද අප අපගේ සහනාධාරවලින් කොටසක් ඒවාට යැව්වා.''

ප්‍රදේශයේ බොහෝ දෙනා ධීවරයෝ, දෛනික කම්කරුවෝ හා කෘෂිකාර්මික කම්කරුවෝ වෙති. සාමාන්‍ය මාසික ආදායම රුපියල් 6,000ක් පමනි.

සරනාගත කඳවුරු 9ක් පිහිටුවනු ලැබ ඇත. ලිංවලින් තුනෙන් දෙකක් ම දූෂනය වී ඇති නිසා ජලය පිටතින් සම්පාදනය කිරීමට සිදුව ඇත.

සුනාමිය මගින් විනාශයට පත් වූ මරුතමුනෙයි අසල පිහිටි අක්බාර් ගම්මානයේ ඉතිරිවී සිටින්නන්ට අපි කතා කලෙමු. ගම්මානයේ හා අවට ජීවත් වූ 6,000ක් ජනයාගෙන් අවම වසයෙන් 2,500ක් මිය ගියහ. දිවි ගලවා ගත් එක් අයකුට අනුව එක්තරා පැතිරුනු පවුලක 43 දෙනෙක් මිය ගියහ. ඉතිරි වී සිටින සමහර අය තවමත් කම්පනයෙන් පෙලෙන අතර කතා කිරීමට නො හැක.

අල්මා මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍යයෙකු වන මොහොමඩ් සමීර් මෙසේ විස්තර කලේ යඃ ''මගේ පවුලේ අය බේරුනා. ඒත් අපේ සියලුම දේපොල නැතිවුනා. සුනාමිය සිදුවන විට මම හිටියේ ගෙදර. පූර්ව අනතුරු ඇඟවීමක් තිබුනේ නැහැ. මා පාසලේ උඩුමහලට දිව ගියා. දුවගන්න පුලුවන් වුන අය බේරුනා. කාන්තාවන්, වැඩිහිටියන්, කුඩා ලමුන් හා වැටුනු අය සියලුම දෙනා මිය ගියා. දින දෙකක් අප කුසගින්නේ හිටියා. ඊයේ - දෙසැම්බර් 28 දා - පලමුවරට අපට ප්‍රමානවත් තරම් ආහාර ලැබුනා.

''ආන්ඩුව උදව් කලේ නැහැ. දේශපාලන පක්ෂ පිලිබඳව කිවයුත්තේත් එය ම යි. අපට උදව් කලේ සාමාන්‍ය ජනයා පමනයි. මගේ සියලුම පොත් විනාශ වුනා. අපේ ඉංග්‍රීසි ගුරුවරයා මිය ගියා. අපේ අහමඩ් සර්වුදීන් විද්‍යාලය විනාශවෙලා.''

1999 වසරේ රජරට විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලැබූ මොහොමඩ් අහසන් මෙසේ කීයඃ ''විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු මට රැකියාවක් සොයා ගැනීමට හැකි වූයේ නැහැ. ආන්ඩුවෙන් ගෙවන උපාධිධාරී පුහුනු වැඩ සටහනට සහභාගි වෙමිනුයි මා සිටියේ. ජීවත් වීම සඳහා මට ලැබෙන්නේ රුපියල් 6,000යි. ඊට පෙර මා කුඩා රැකියාවන් ගනනාවක් කලා.

''මගේ පියා විශ්‍රාමික ගුරුවරයෙක්. මෙහි නැවතී සිටීමට අප බයයි. මෙම ස්ථානයෙන් පිටවීමටයි අප සැලසුම් කරමින් සිටින්නේ. ඒත් යන්නේ කොහෙට ද කියලා ස්ථිර අදහසක් නැහැ. ඥාතීන්ගේ හා මිතුරන්ගේ උදව්වෙන් අප නො මැරී සිටිනවා. ඒත් ඔවුන්ට එලෙස උදව් කරන්න පුලුවන් කොපමන කාලයකට ද? අප ජීවත් වූ මට්ටමට ආපසු යාමට අවුරුදු 25ක් වත් ගතවේවි. මිය ගිය අයගේ සිරුරු සොයා ගැනීමේ හා වල දැමීමේ නිරතවෙමිනුයි මා සිටියේ. දැන් මගේ අත්වල කුෂ්ටයක් හටගෙන.''

29 හැවිරිදි නෆාර් සුෆියාස් ට සුනාමිය නිසා සියලුම දේ අහිමි විය. ''මම අවුරුදු 3ක් කටාර් රටේ රියදුරකු ලෙස සේවය කලා. ඒ හම්බ කර ගත් දේවලින් මම රත්තරන් බඩු කඩයක් ආරම්භ කලා. නමුත් දැන් කඩය විනාශ වෙලා. කඩය තිබුනේ මගේ නිවසේ ඉදිරිපස කොටසෙ. සියලුම ගෘහ උපකරනත් ගසාගෙන ගිහින්. මම කල්පනා කරමින් සිටින්නේ නැවත පිටරට යාමට යි. මට මෙහි නැවතීමට අදහසක් නැහැ.''

50 හැවිරිදි ආරක්ෂක නිලධාරියකු වන මොහොමඩ් අලි ට ද ඔහුගේ නිවස අහිමි විය. ''මාත් මගේ බිරිඳත් වසර 10ක් සවුදි අරාබියේ වැඩ කලා. මේ නිවස මා තනා ගත්තේ ඒ හම්බ කරපු මුදල්වලින්. දැන් සියල්ල ගසාගෙන ගිහින්. විනාශ වූ නිවසේ තිබී මියගිය සිරුරු 3ක් අප සොයා ගත්තා. පිටතින් සිරුරු 15ක් තුබුනා. මට මගේ ඥාතීන් 23 දෙනෙක් අහිමි වුනා.

''මම කොහොම ද තව නිවසක් තනාගන්නේ. මුල සිටන් පටන්ගන්න මා වයස වැඩියි. මා ඉන්නේ ඥාතීන් සමග. මගේ දූවරු දෙදෙනාටත් ඔවුන්ගේ නිවාස අහිමි වුනා. ඔවුන් මෙහි ජීවත් වීමට බයයි. මම වැඩ කරන්නේ කොලඹ. මා නැවත වැඩට යා යුතු යි. නමුත් මගේ බිරිඳ හා පවුල මෙහි දමා යාමට නො හැකි යි. ඔවුන් තනියෙන් සිටීමට බියයි.''

සරනාගත බොහෝ දෙනා දේශපාලන සංස්ථාපිතය සමග කෝපයෙන් පසුවෙති. 36 හැවිරිදි ගුරුවරයකු වන අබ්දුල් හකීම් ජීවත් වූයේ වෙරලාසන්න අක්බාර් ගම්මානයේ ය. ඔහුගේ නිවස ගොඩ නැගීමට වසර 6ක් ගත විය. දැන් සියල්ල අහිමිව ඇති අතර ඔහුගේ ඥාතීන්ගෙන් 16 දෙනෙකු මිය ගොසිනි. ''ආන්ඩුව උදව් කරයි කියා බලාපොරොත්තුවෙන් සිටිනවා. නමුත් මේ මොහොතේ දී කිසිවක් පොරොන්දු වී නැහැ''යි ඔහු කීය.

තවත් පුද්ගලයෙක්ඃ ''විපක්ෂ එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (ශ්‍රීලමුකො) කිසිවක් කර නැහැ. (ශ්‍රීලමුකො නායකයන් වන) රවුෆ් හකීම් සහ ෆේරියල් අෂ්රෆ් ඇවිත් බැලුවා. නමුත් අපට උදව් කරනවා යයි පොරොන්දු වූයේ නැහැ. සෑම පවුලක ට ම මේ විපත බලපා තිබෙනවා. අපේ දරුවන් බොහෝ දෙනෙක් මිය ගිහින්. ආර්ථික ක්‍රියාකාරීත්වය කඩා වැටිලා. ජීවිකාව ගෙන යාමට අපට ආන්ඩුවේ උදව් අවශ්‍යයි.''

### කල්ලාරු

දෙසැම්බර් 31 දා, රජයේ සේවකයන් බහුලව ජීවත් වන මඩකලපුව දිස්ත්‍රික්කයේ පෙරිය කල්ලාරු ප්‍රදේශයට අපි ගියෙමු. අනෙකුත් අය ජීවිකාව සරි කර ගන්නේ වඩු කර්මාන්තය, මේසන් කර්මාන්තය, ධීවර කර්මාන්තය හා විවිධ වැඩවල යෙදීමෙනි. සුනාමිය දෙදිසාවෙන් ම දැඩි ලෙස මාර්ගයන්ට අලාභහානි කලේ ය. ඉතිරි වී සිටින්නන්ව එක් පැත්තකින් මුහුදෙන් ද අනෙක් පසින් කලපුවෙන් ද සිර කරනු ලැබුනි. මෙම ප්‍රදේශයට දින 4ක් පුරා සහනාධාර ලඟා නො වූ අතර ජනයා බඩගින්නේ සිටිය හ. ජල තරංගය ප්‍රාදේශීය රෝහල සම්පූර්නයෙන් ම විනාශ කරනු ලැබී ය.

අපි අපව ලෝසවෙඅ පුවත්පත් කලාවේදීන් ලෙස හඳුන්වා දීමෙන් පසු ජනයා වට විය. මහලු පිරිමි, කාන්තාවන්ට ශිෂ්‍යයන්ට හා රැකියා විරහිත තරුනයන්ට - 20ක් පමන - තමන්ගේ ගැටලු හා අත් දැකීම් පිලිබඳව කතා කිරීමට අවශ්‍ය විය.

තරුන ගෘහනියක වන සුමති ප්‍රකාශ කලේ: ''මගේ නිවස තිබුනේ මුහුද අයිනෙම. රැල්ල එනවා මා දුටුවා. අනෙක් නිවෙස්වලට දිව ගොස් ඒවායේ සිටි අයට මම රැල්ල ගැන කියපු නිසා ඔවුන්ට බේරෙන්න පුලුවන් වුනා. ජනයා බොහෝ දෙනා දෛනික කම්කරුවන්. විනාශ වූ නිවාස වැඩි කොටසක් ඔවුන්ගේ.''

තම පවුලේ තත්වය පිලිබඳව විස්තර කරමින් ඇය මෙසේ කීවා ය: ''අපේ නිවස සම්පූර්නයෙන් ම විනාශ වුනා. ගෘහ භාන්ඩ කිසිවක් ඉතිරිවුනේ නැහැ. මේසන් බාස් කෙනෙක් දිනකට රුපියල් 500ක් ලැබුවත් කම්කරුවකුට ලැබෙන්නේ දිනකට රුපියල් 300ක් පමනයි. සමහර දිනවල ධීවරයන්ට මාලු අහුවෙන්නේ නැහැ. මා විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය සමත් වී තිබෙනවා. නමුත් රැකියාවක් සොයා ගන්න බැරි වුනා. මගේ ස්වාමිපුරුෂයාට කිසිම ස්ථිර රැකියාවක් නැහැ. ඔහුත් දෛනික කම්කරුවෙක් පමනයි. සාමාන්‍යයෙන් ඔහු දිනකට රුපියල් 200ක් හම්බ කරනවා. නමුත් ඔහුට දිනපතා වැඩ ලැබෙන්නේ නැහැ.

''සිංහල ජනයා අපට බොහෝ උදව් කොට තිබෙනවා. අද පටන් සහනාධාර බෙදා දීමට කොමිටියක් පත් කොට තිබෙනවා. ලැබෙන සියලු බඩු එක් ස්ථානයක ගබඩා කොට බෙදා හරිනවා. සෑම පවුලකට ම අංකයක් දී තිබෙනවා. කොමිටිය අංකය කතා කොට බඩු දෙනවා.''

මඩකලපුවේ රියදුරකු වන සුන්දරලිංගම් විස්තර කලේ: ''එල්ටීටීඊය හා විශේෂ කාර්ය බලකාය (පොලිස් කොමාන්ඩෝ අංශය) උදව් කොට තිබෙනවා. සාමාන්‍ය සිංහල ජනයා බෙහෝ ඈත ප්‍රදේශවලින් අපට උදව් කිරීමට පැමිනියා. අප කවදාවත් ඒවා අමතක කරන්නේ නැහැ. ප්‍රවාහන ගැටලු නිසා මුල් දින දෙක තුනක් යනකන් ආහාර අප වෙත ලැබුනේ නැහැ. අප බඩගින්නේ සිටියා.''

කල්ලාරු මධ්‍ය මහා විද්‍යාලයේ 12 හැවිරිදි ශිෂ්‍යයකු වන ලක්ෂාන් මෙසේ පැවසී ය: ''මගේ පාසලටත් හානි වුනා. සිංහල ජනයා පැමින අපට උදව් කලා. අපි ඔවුන්ට ස්තුති කරනවා. අපට වාර්ගික, ආගමික, හා භාෂාමය බෙදීම් අවශ්‍ය නැහැ. අපට වෙන ම දෙමල රාජ්‍යයක් අවශ්‍ය නැහැ. අපට සිංහලයන් සමග ජීවත්වීමට අවශ්‍යයි. මාර්ගය පිලිසකර කිරීමෙන් පසු සහනාධාර රැගෙන අප වෙත ප්‍රථමයෙන් පැමිනි ජනයා සිංහල අය.''

සුනාමිය, එල්ටීටීඊය හා ශ්‍රී ලංකා ආන්ඩුව අතර ගැටුම අවසන් කරනු ඇතැයි සුන්දරලිංගම් බලාපොරොත්තු පල කලේ ය. ''යුද්ධ කාලයේ අප ජීවත්වුනේ බියෙන්. සටන් විරාම ගිවිසුම අත්සන් තැබූ 2001 පටන් අපි හොඳින් ජීවත් වෙමින් සිටිනවා. මෙය සාමය සඳහා අවස්ථාවක්. මෙම ව්‍යසනය හරහා දෙවියන් සියලු දෙනා එක්තැන් කොට තිබෙනවා.''

'' සෑම දෙනා ම එකට එකතු වී එකට වැඩකොට තිබෙනවා. අපට සිදුවී ඇති දෙය දුටුවාම සිංහල ජනයා ඇඬුවා. තව දුරටත් අප අතර වාර්ගික, කුල හෝ ආගමික වෙනස්කම් තිබිය යුතු නැහැ. එලෙස ම ආන්ඩුව ජනයාව බෙදා වෙන් කල යුතු නැහැ'' යි තවත් පුද්ගලයෙක් කීය.

පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ අවසන් වසර සිසුවියක වන දූසර්සිනී ජනයාට අවශ්‍ය දෑ කියාගෙන ගියාය. ''පලමුවෙන් ම ආන්ඩුව මාර්ගය පිලිසකර කල යුතුයි අපේ රෝහලට හානි සිදුවෙලා. අවශ්‍ය වුවහොත් අප අනෙක් රෝහල්වලට යා යුතුයි. පාරක් නැතුව කොහොමද අපි ඒක කරන්නේ? සුනාමිය සිදු වන විට මම හිටියේ කැම්පස් එකේ. ඊයේ තමයි ආවේ. බස් තිබුනේ නැති නිසා පයින් ඒමට සිදු වුනා. අපට බොහෝ දේ අහිමි වුනා. අපට යුද්ධය අවශ්‍ය නැහැ. නැවත යුද්ධය පටන් ගත්තොත් අපි ඉවරයි. අප සියලු දෙනා එක්සත් විය යුතුයි. සිංහල ජනයා අපට උදවු කොට තිබෙනවා.''

''ආන්ඩුව ක්ෂනිකව මාර්ගය පිලිසකර කල යුතුයි. පලමුවෙන් ම කරන්න ඕන ඒක. නැවතත් මුහුද ආසන්නයේ නිවාස ගොඩ නැගීමට ජනයා බියෙන් පසුවන නිසා වෙරලෙන් ඈත සුදුසු ප්‍රදේශ සපයා දීමට ආන්ඩුව කටයුතු කල යුතුයි. උදවු නැතිව නැවත නිවාස ගොඩනැගීමට අපට වසර ගනනක් ගතවෙයි. අලුතෙන් ගෙවල් හදන්න ආන්ඩුව උදවු කල යුතුයි'' සුන්දරලිංගම් වැඩිදුරටත් කීය.

කොලඹ බලා ආපසු ඒමට පෙර ජනවාරි 1 දා අපි බන්ඩාරනායක විද්‍යාලයේ නැවතී සිටින තරුන ජනයාට කතා කෙලෙමු. අනෙකුත් ප්‍රදේශවල දෙමල සරනාගතයින් මෙන් ම ඔවුන් ද සිංහල කම්කරුවන් හා ගම්වැසියන් ලබා දුන් සහයෝගයට තම කෘතඥතාව හා ගෞරවය ප්‍රකාශ කලහ. ''අපි මෙම ව්‍යසනයෙන් බොහෝ දේ ඉගෙන ගත්තා.'' යි තරුන ශිෂ්‍යාවක වන සියානි පැවසී ය. ''ආන්ඩුව කිසිවක් කලේ නැහැ. උපකාර කලේ සිංහල ජනයා පමනයි.''

තවත් තරුනයකු වන පිරවි එයට එකඟතාව පල කලේ ය: ''සිංහල, මුස්ලිම් හා දෙමල ජනයා එකට එකතු විය යුතුයි. එල්ටීටීඊයත් උදව් කරමින් සිටිනවා. නමුත් අපට වෙන ම දෙමල ඊලම් රාජ්‍යයක් අවශ්‍ය නැහැ.'' තවත් තරුනියක් ''අපට දෙමල ඊලමක් අවශ්‍ය නැහැ. සිංහල හා මුස්ලිම් ජනයා සමග සමගියෙන් අප ජීවත් විය යුතුයි.'' යයි කීවා ය.